| කොවිඩ් 19 සති පාසල | | |
|---|---|---|
| සබරගමුව | | |
| විෂය-ඉතිහාසය | ශ්‍රේණිය - 09 ශ්‍රේණිය | වාරය- I |

**ඒකකය 01** - ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි යටතට පත්වීම.

**පැවරුම්** - **අංක 04**

**ක්‍රියාකාරකම - 04-** ලන්දේසීන් උඩරට රාජධානිය සමඟ පැවති සබඳතා වල ස්වරූපය සොයා බලමු.

**හැඳින්වීම -** ලන්දේසීන් විසින් උඩරට රාජධානියත් සමඟ සමීපව හා සුහදව කටයුතු කිරීමට යොමුව ඇත. එයට හේතුව නම් උඩරට ප්‍රදේශයේ පැවති ආර්ථිකමය වැදගත්කම වේ. ඒ තුළ ගැටුම් ඇතිකර නොගැනීමට ඔවුන් වගබලා ඇත. ඒ බව උඩරට රාජධානියේ ඇතැම් පාලකයින් හා සම්බන්ධව ඔවුන් දැක්වූ විවිධ ප්‍රතිචාර මඟින් හෙළිවේ. එහෙත් ඇතැම් අවස්ථාවල උඩරට අභ්‍යන්තර දේශපාලනික ගැටුම් ඇතිවන අවස්ථා තුළ එම ප්‍රදේශයේ දේශපාලනික බලය තහවුරු කර ගැනීමේ අරමුණින් මොවුන් උඩරට ආක්‍රමණය කිරීමට යොමුවූ අවස්ථාද වේ.

**සිසු උපදෙස් :-**

පියවර 01 - පෙළපොතේ පිටු අංක 10 සිට 12 දක්වා හොඳින් කියවා ගන්න.

පියවර 02 -පසුගිය සතියේ ප්‍රශ්නාවලිය අවසන්වූ තැනින් ඉහතින් දී ඇති හැඳින්වීම සටහන් කර ගන්න.

පියවර 03 - පහත දී ඇති ක්‍රියාකාරකමේ නිරත වන්න.(එම කොටස් සටහන් කර ගන්න.)

**ක්‍රියාකාරකම අංක 04**

1. උඩරට රාජධානිය හා ලන්දේසි අතර මිත්‍ර සබඳතා වර්ධනය කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග 03ක් ලියා දක්වන්න.
2. කුණ්ඩසාලේ කුමරු නමින් ප්‍රකට වූ උඩරට රජු නම් කරන්න.
3. උඩරට රාජධානිය දකුණු ඉන්දියාවත් සමඟ වෙළඳ සබඳතා පවත්වා ගත් ප්‍රධාන වරායන් 03ක් දක්වන්න.
4. උඩරට හා ලන්දේසින් අතර මිත්‍රත්වය පලුදු වූ අවස්ථාවන් ලියා දක්වන්න.
5. සිංහලයේ අවසාන රජු නම් කරන්න.
6. නායක්කර් වංශික ප්‍රථම රජතුමා කවුරුන්ද?
7. ලන්දේසින්ගෙන් නැවු ලබා ගෙන සියම් දේශයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වා ගැනීමට කටයුතු කළ රජු කවුරුන්ද?
8. 1753 දී මෙරටට සියම් දේශයෙන් මෙරටට පැමිණි භික්ෂූන් වහන්සේ කවුරුන්ද?
9. ඒ සමඟ ආරම්භ වූ නිකාය කුමක්ද?
10. 1762 උඩරටට පැමිණි ඉංග්‍රීසි ජාතික දූතයා කවුරුන්ද?
11. 1765 උඩරට ආක්‍රමණය මෙහෙය වූ ලන්දේසි ආණ්ඩුකරු නම් කරන්න.
12. 1766 උඩරට රජු හා ඇති කර ගත් ගිවිසුමේ කොන්දේසි මොනවාද?
13. එම ගිවිසුමෙන් ලාංකිකයන්ට අත් වූ අවාසි සහගත තතවයන් දක්වන්න.

සැකසුම - උදාර අරවින්න්ද - නිවිතිගල අධ්‍යාපන කලාපය

ර/කලවාන ජාතික පාසල